*සැ. යු.* — 2015.03.13 දින පළ වූ අංක 1,906 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,907 - 2015 මාර්තු මස 20 වැනි සිකුරාදා - 2015.03.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 570 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 608 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 610 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 10 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*“යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.”*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

607- B 80931— 5,302 (2015/03)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ (මහනුවර මහ නගර සභාවේ) රස පරීක්ෂක තනතුරට බඳවා ගැනීම

1.0. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ (මහනුවර මහ නගර සභාවේ) රස පරීක්ෂක තනතුරෙහි පවතින පුරප්පාඩුව (01) සම්පූර්ණ කිරීමට, බඳවා ගැනීම සඳහා සුදුසුකම් සහිත අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0. නියමිත ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ලියාපදිංචි කළ තැපෑලෙන් 2015.04.16 දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර" යන ලිපිනයට එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ (මහනුවර මහ නගර සභාවේ) රස පරීක්ෂක තනතුරට බඳවා ගැනීම" යන්න පැහැදිළි ලෙස ලිවිය යුතු ය.

3.0 *බඳවා ගැනීමේ කොන්දේසි.-*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

(ii) මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ (මහනුවර මහ නගර සභාවේ) රස පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල විධිවිධානවලට ද යටත් ව තෝරාගනු ලබන අපේක්ෂකයකු රස පරීක්ෂක තනතුරට පත් කරනු ලැබේ.

4.0 *වැටුප.-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව රස පරීක්ෂක තනතුරේ වැටුප් කේත අංකය SL 1 - 2006 වේ. වැටුප් පරිමාණය : රු. 22,935- 10 x 645 - 8 x 790 රු. 35,705 වේ.

5.0 *පොදු සුදුසුකම්.-*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික විය යුතු ය.

(ii) අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට පූර්වාසන්න අඛණ්ඩව මධ්‍යම පළාතේ වසර 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45කට නොවැඩි විය යුතු ය. (රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත වයස් සීමාව බලනොපානු ඇත.)

6.0 *අධ්‍යාපන හා අනෙක් සුදුසුකම්.-*

(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් රසායන විද්‍යාව විෂයය පිළිබඳව පළමුවැනි පෙළ හෝ දෙවැනි පෙළ ගෞරව උපාධියක් ලබා සිටින අයෙකු වීම,

*හෝ*

(ii) මහා බ්‍රිතාන්‍යයේ සහ අයර්ලන්තයේ රසායන විද්‍යාව පිළිබඳ රාජකීය ආයතනයේ සාමාජිකයෙකු වීම,

*හෝ*

(iii) රසායන විද්‍යාව පිළිබඳ ඊට වඩා උසස් ශාස්ත්‍රීය හෝ වෘත්තීය සුදුසුකම් තිබීම.

07. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය.-*

(අ) අයදුම්පත්‍රය ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් ඒ 4 (සෙ. මී. 21 x 29) ප්‍රමාණයේ කඩදාසිවල සකස් කර ඉදිරිපත් කළ යුතු ය. අදාළ අයදුම්පත්‍රය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.cp.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

(ආ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240, 360 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(ඇ) දැනට රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්ත අපේක්ෂකයන් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මගින් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. යම්කිසි අපේක්ෂකයෙක් එසේ කිරීමට අපොහොසත් වේ නම් ඔහු නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

(ඈ) සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රය නැති වීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.0 *බඳවා ගැනීමේ ක්‍රමය.-*මෙම අයදුම්පත් කැඳවීම අනුව අදාල අයදුම්කරුවන්ගේ කුසලතාවය මැන බැලීම සඳහා පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එම පරීක්ෂණයෙන් ලකුණු ලබා ගන්නා ප්‍රමුඛතාවය මත මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ (මහනුවර මහ නගර සභාවේ) රස පරීක්ෂක තනතුර සඳහා සුදුස්සෙකු තෝරා ගනු ලැබේ.

9.0 *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.-* අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇති බව සේවය කරන කාලය තුළ කවර අවස්ථාවක දී හෝ ඔප්පු වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

10.0 පත්වීම ක්‍රියාත්මක කරන දිනය හා මෙම පුරප්පාඩුව පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අතර මෙම බඳවා ගැනීම් නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ආර්. එම්. එන්. රත්නායක,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244,
කටුගස්තොට පාර,
මහනුවර.

වෙබ් අඩවිය : www.psc.cp.gov.lk

ආදර්ශ අයදුම් පත්‍රය

**මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ (මහනුවර මහ නගර සභාවේ) රස පරීක්ෂක තනතුරට බඳවා ගැනීම**

[ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

1. (i) අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. PERERA A. B. :————.

   (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————..

2. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

   (ii) රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

   (iii) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :————.

   (iv) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

4. දුරකථන අංකය : [ | | | | | | | | | ]

5. (i) ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
   පුරුෂ - 0 [ ]
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

   (ii) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ලියාපදිංචියෙන් ද යන වග :————.

6. විවාහක/අවිවාහක භාවය : විවාහක - 1
   අවිවාහක - 2 [ ]
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

7. (i) උපන් දිනය :

   වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

   (ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

   අවුරුදු : [ | | | ] මාස : [ | ] දින : [ | ]

8. අධ්‍යාපන සුදුසුකම් :————.

9. වෙනත් සුදුසුකම් :————.

10. ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ඔව්/නැත :————.

    ඔව් නම් විස්තර සඳහන් කරන්න :————.

12. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව ඔප්පුවුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-*

.......................... පදිංචි..................................... නැමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත් ............................. මස............................... දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————.
නම හා පදවි නාමය :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

සටහන : දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි.

14. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.-*

මෙම අයදුම්කරු/අයදුම්කාරිය මෙහි 07, 08 සහ 09 වැනි ඡේදවල දී ඇති තොරතුරු නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ හැසිරීම හා වැඩ සතුටුදායක වූ බවත්, අදාළ බඳවා ගැනීමේ නිවේදනය ප්‍රකාරව ඔහු/ඇය මෙම තනතුර සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් මෙයින් සහතික කරමි. තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදා හැරිය හැකි ය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

දිනය :————.

සහතික කරන ලද නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.

03-457

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව**

සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන 2 සේවා ගණය උපදේශක (පේෂකර්ම) III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2015

1.0 සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන 2 සේවා ගණය උපදේශක (පේෂකර්ම) III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 සබරගමුව පළාත් කර්මාන්ත විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් සමත්වූවන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ලිඛිත හා වෘත්තීය යන පරීක්ෂණ දෙකෙන් සමත්වූවන්ගෙන් ලබා ගන්නා ලද මුළු ලකුණු එකතුවෙන් වැඩි ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙලට පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබේ.

3.0 3.1 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම නොපිරවීම පිළිබඳ අවසාන තීරණය ගැනීමේ බලය සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය සතුය.

4.0 *තනතුරට හිමි වැටුප් පරිමාණය.-*

MN1-2006A වැටුප් කේත අංක යටතේ සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි කළමණාකරන සහකාර තාක්ෂණික නොවන 2 සේවා ගණය.

උපදේශක (පේෂකර්ම) III, II හා I ඇති පන්තිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - 22,040 වේ.

රු. 14,740 ඔබ්බට යාම සඳහා II වැනි පන්තියට උසස්වීම ද රු.16,680 න් ඔබ්බට යාම සඳහා I වැනි පන්තියට උසස්වීමද ලබාගත යුතුය.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

6.0 *සුදුසුකම්.-* සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන 2 සේවා ගණය උපදේශක (පේෂකර්ම) III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාල වේ.

*(අ)* අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට සබරගමුව පළාත තුළ අවු. 03 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

*(ආ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

*(ඇ)* (i) සෑම අපේක්ෂකයෙකුම සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ii) සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාල සියලු සුදුසුකම්, අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

*(ඈ)* පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(1) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය යන විෂයන් දෙකටම සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් (06) හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

7.0 *විභාග පටිපාටිය.-* විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්තවේ. මෙම විභාගය සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත් වේ.

| | *ලකුණු* | *කාලය* |
|---|---|---|
| 01. සාමාන්‍ය දැනීම | 100 යි | පැය 01 යි |
| 02. පේෂකර්මාන්තය පිළිබඳ අවබෝධය | 100 යි | පැය 03 යි |

*සාමාන්‍ය දැනීම.-* මෙම ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තර කාලීන සමාජීය, දේශපාලන, ආර්ථික තොරතුරු පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

(රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයින්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.)

*පේෂ කර්මාන්තය පිළිබඳ අවබෝධය.-* මෙම ප්‍රශ්න පත්‍රය මගින් අපේක්ෂකයින්ගේ පේෂකර්මාන්තය පිළිබඳ අවබෝධය පරීක්ෂා කෙරේ. එහිදී වියමන් ක්‍රම, පොදු බැඳීමේ සහ පෑගීමේ ක්‍රම, නූල් මිශ්‍රණ සහ විවිධ රෙදිපිළිවල ප්‍රමිති

පේෂ කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය, ඒවායේ ගුණාංග, නූල් මිශ්‍රණ සහ විවිධ රෙදිපිළිවල ප්‍රමිති.

ඒකක පරිවර්තනය, මෙට්‍රික් ක්‍රමය, රීඩ් සහ හීල්ස් අංක කිරීම
විවිධ නිෂ්පාදනයන්ට අදාළ ඇස්තමේන්තු
දික් සහ හරස් නූල් එතීම, වෝප් පිළියෙල කිරීම, යන්ත්‍රගත කිරීම, සහ විවීම යන කොටස් ආදිය පිළිබඳ සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

8.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසුබව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක

අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

9.0 *විභාග ගාස්තු.*- විභාග ගාස්තුව රු. 600 කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය මුදලින් ගෙවා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවනසේ ඇලවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සමාජ සුභසාධන, පරිවාස ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ ගිණුම් අංක 0001016456 ට බැර වන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගත යුතු වේ.

10.0 *විභාගය පැවැත්වීමට යෝජිත නගරය.*-

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| රත්නපුර | 1 |

11.0 *අයදුම්පත්‍ර.*- ඒ. 4 (21cm x 29cm) (සාමාන්‍ය හාෆ්සීට්) ප්‍රමාණයේ කඩදාසි දෙපැත්ත භාවිතා කරමින්,

*(අ)* අංක 01 සිට 4.1 තෙක් ඡේදයක් පළමුවන පිටුවට ද,

*(ආ)* ඉතිරි ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත්වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

*(ඇ)* අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය අලවා නොමැති, නියමිත සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය හැර වෙනත් කිසිදු සහතිකයක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකළ යුතු ය.

11.1 නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනීසිටීමට සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් ඉඩදෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂාකරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන 2 සේවා ගණය උපදේශක (පේෂකර්ම) III වන පන්තියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2015" යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

11.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක, විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැෂට් බළ* තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 240,360 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතු ය.

11.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2015.04.30 දිනට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ලේකම්,<br>
සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක ග්‍රාම සංවර්ධන<br>
හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,<br>
සබරගමුව පළාත් සභාව,<br>
නවනගරය, රත්නපුර.

12.0 *විභාගයට පෙනී සිටීම.*- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් ඔබගේ ඉල්ලීමේ ලිපිය ද ළඟ තබා ගෙනම සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

13.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14.0 අපේක්ෂකයෙකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් සමාජ සුභසාධන, පරිවාස ළමාරක්ෂක ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට ද විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඩී. එම්. මාලනී,
ලේකම්,
සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

2015 පෙබරවාරි මස 25 වැනි දින,
සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නවනගරය,
රත්නපුර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

සබරගමුව පළාත් රාජ්‍ය සේවය

සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන 2 සේවා ගණය උපදේශක (පේෂකර්ම) III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

Competitive Examination for Management Assistant non - Technical segment 2 Instructor (Handloom) Grade III, Department of Industries Development Sabaragamuwa Provincial Council- 2015

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාග නිවේදනයට අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක විභාග නිවේදනයේ 10 ඡේදය බලන්න.)

| නගරය | නගර අංකය |
|---|---|
| | |

1.0 1.1 මුලකුරු අගට යෙදා මුලකුරු සමග නම :..............................................
..............................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : PERERA A. B. C. )

1.2 සම්පූර්ණ නම :..............................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :..............................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය :..............................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :..............................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :..............................................
..............................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 පෞද්ගලික දුරකථන අංකය : | | | | | | | | | | |

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය : 0 - පුරුෂ
1 - ස්ත්‍රී
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 4.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - රත්නපුර - 1
කෑගල්ල - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..............................................

4.3 පදිංචිව සිටින කාල සීමාව :..............................................

4.4 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :..............................................

5.0 5.1 උපන් දිනය :

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

5.2 2015.04.30 දිනට අවුරුදු : | | | මාස : | | | දින : | | |

6.0 අධ්‍යාපන සුදුසුකම්.-

6.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

6.2 අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? (අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

8.0 *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර.-*

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපතේ අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙනසේ මෙහි අලවන්න<br><br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

9.0 *අයදුම්කරුගේ සහතිකය ඃ*

*(අ)* අයදුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවරුදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැක අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

*(ආ)* ම විසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද ප්‍රකාශ කරමි.

*(ඇ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

*(ඈ)* විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස, ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන....................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, මුදල් ගෙවන ලද ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

.............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

03-548

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.